# පැළෑටි හා ගස්වැල්

**5 ශ්‍රේණිය**

**3 වන පාඩම**

- අතීතයේ සිට වර්තමානය තෙක් ගස්වැල් හා මිනිසා අතර ඇත්තේ සමීප සම්බන්ධතාවයකි.

- මිනිසාට ආහාර, ඖෂධ, ගෘහ උපකරණ සපයා ගැනීමට හා සකසා ගැනීම මෙන්ම පරිසරය අලංකාර කිරීමට ද ගස්වැල් තම දායකත්වය ලබාදේ. එබැවින් අප ගස්වැල් ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතු අතර ම රුක් රෝපණය කරමින් ගස්වැල්වල පැවැත්මටද දායක විය යුතුය.

**<u>ශාකවලින් අපට ලැබෙන ප්‍රයෝජන</u>**

1. පසෙහි ජලය රඳවා ගැනීමට.
2. පොහොර ලබාදීම.
3. අලුත් එළවළු පලතුරු ලබාදීම.
4. පාංශු ඛාදනය අඩුවීම.
5. සෙවණ ලැබීම.
6. පාරිසරික සුන්දරත්වය ලබාදීම මඟින් මානසික සුවයක් ලබාදීම.

**<u>වනාන්තර විනාශය නිසා සිදුවන හානි.</u>**

1. ජල මූලාශ්‍ර සිඳීයාම.
2. නැවුම් වාතය හිඟ වීම.
3. සතුන්ට තමන්ගේ වාසස්ථාන අහිමි වීම.
4. ආහාර හිඟ වීම.
5. ඖෂධ ලබා ගැනීමේ අපහසුතාවය.

**<u>ශ්‍රී ලංකාවට ආවේණික ශාක.</u>**

| | | | |
|---|---|---|---|
| 1. බදුල්ල | 2. ආරිද්ද | 3. බිං කෙහොඹ | 4. හොර |
| 5. ගොඩපර | 6. ලේන්තැරි | 7. එළ ගොරක | 8. දෝතලු |
| 9. හීං බෝවිටියා | 10. කලු මැදිරිය | 11. දොරණ | 12. දියපර |
| 13. කැකුණ | 14. කීන | 15. සුදු බිනර | 16. කෙකටිය |
| 17. මා වේවැල් | 18. ඇටඹ | | |

ශාකයක මුල් නිරීක්ෂණය කරන්න. (පහත සඳහන් කරුණුවලට අවධානය යොමු කරමින්).

1. මුල් හටගෙන ඇති ආකාරය.
2. මුල් බෙදී ඇති ආකාරය.

3. මුල් විහිදී ඇති දුර.

- ඇතැම් විශාල ගස්වල මුදුන් මුලක් තිබෙන අතර සමහර ශාකවල නොමැත.
- තාල වර්ගයට අයත් ගස්වල මුදුන් මුලක් නොමැත.
- තාල වර්ගයට අයත් ගස්වල අතු නොබෙදේ.

**<u>තාල වර්ගයට අයත් ගස්.</u>**

1. කිතුල් 2. පොල් 3. පුවක් 4. රට ඉඳි 5. තල්

## බීජ ව්‍යාප්තිය.

**<u>ජලය මගින් ව්‍යාප්ත වන බීජ හා ගෙඩි වර්ග.</u>**

1. පොල් 2. පුවක් 3. කුඹුක් 4. ඕලු 5. නෙළුම් 6. කිරල
7. මානෙල් 8. දිය කඳුරු

**<u>සුළඟ මගින් ව්‍යාප්ත වන බීජ හා ගෙඩි වර්ග.</u>**

1. තොටිල 2. ගම්මාලු 3. වරා 4. කොට්ට පුළුන්
5. ඉද්ද 6. මුරුංගා 7. හවරිනුග 8. මොනර කුඩුම්බිය

**<u>පිපිරීම (ස්ඵෝටනය) මගින් ව්‍යාප්ත වන බීජ හා ගෙඩි වර්ග.</u>**

1. රබර් 2. මුංඇට 3. කව්පි 4. අබ
5. ඔළිඳ 6. මදටිය 7. කුඩලු 8. තල

**<u>සතුන් මගින් ව්‍යාප්ත වන බීජ හා ගෙඩි වර්ග.</u>**

1. කජු 2. අඹ 3. නුග 4. කොට්ටම්බා
5. පේර 6. ගස්ලබු 7. වරකා/වැල

## විවිධ පරිසර පද්ධතිවල වැවෙන ශාක.

**<u>වියළි කලාපීය පරිසරයේ වැවෙන ශාක.</u>**

1. දිවුල් 2. බුරුත 3. කළුවර 4. තේක්ක 5. වීර
6. පලු 7. පතොක් 8. එරමිණියා 9. බෝගන්විලා

**තෙත් කලාපීය පරිසරයේ වැවෙන ශාක.**

1. මීවන වර්ග	2. ඕකිඩ් වර්ග	3. තේ	4. රබර්

5. දූරියන්	6. මැංගුස්

**ජලය ආශ්‍රිත පරිසරයේ වැවෙන ශාක**

1. හයිඩ්‍රිල්ලා	2. ඕලු	3. නෙලුම්	4. මානෙල්	5. ගොඩපර	6. ගල්ලැහැ

**කඩොලාන ආශ්‍රිත පරිසරයේ වැවෙන ශාක.**

1. මණ්ඩා	2. මල් කඩොල්	3. රතු කඩොල්	4. කිරල

5. කඳුරු	6. හීන් කඩොල්	7. මුට්ටි කඩොල්	8. වැටකෙයියා

**ශ්‍රී ලංකාවේ ඓතිහාසික ශාක ගැන කියවෙන ගීත.**

පිනවන දුටු තැන සැම - ගඟ ළඟ පිහිටි කදිම
තුරු පෙළ අවට සැදීම - යුත් සෙවනැල්

ගනමේ කුලෙව් දිලීම - විහඟුන් මත රැව්දීම
සුළඟින් පත් ලෙලදීම - ඇති සැම කල්

යන එන දන සැමගේම - එහි ඉඳ ගිම් සැලසීම
දසදිගු අත විහිදීම - තිබෙන විසල්

දෙනිපිටියටම ඉතා ම - වටිනා මහ නුග දූව
බලයකි එහි සිතුසේ ම - නිලඹර පුල්

(දෙනිපිටියේ නුගරුක - ගජමන් නෝනා)

සැකසීම :- බී.ආර්.එම්.අයි.බී. බොරළුව මයා
කෑ/මාව/ බැමිණිවත්ත මහා විද්‍යාලය.
මාවනැල්ල අධ්‍යාපන කලාපය